# තනතුරු පුරප්පාඩු

## කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ පවත්නා පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සංවර්ධන නිලධාරී

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කෘෂිකර්මය/ අලෙවිකරණය / රක්ෂණය/ වාණිජ්‍යය/ ආර්ථික විද්‍යාව/ සංඛ්‍යාන විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් සාමාන්‍ය උපාධියක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MA 3 රු.32,200 - 445x10 - 660x11 -730x10 - 750x5 - 54,960/- (MA 3 - 2016) වේ.

(මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**වයස් සීමාව :**

වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු පුරප්පාඩු පුරවන අවස්ථාව වන විට පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව සැලකිල්ලට ගෙන පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි විවෘත තරග විභාගය හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීමෙන් පසු බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

## කළමනාකරණ සහකාර

(අ) i. සිංහල / දෙමළ භාෂාව

ii. ගණිතය ඇතුළුව

iii. තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**වැටුප් පරිමාණය :**

2016.04.25 දිනැති අංක 02/2016 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය MA 1-1 රු. 27,910 - 300X10 - 350X7 - 495X4 - 660X20 - 48,540/- (MA 1-1 - 2016) වේ.

(මීට අමතරව මණ්ඩලය විසින් අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.)

**වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

බාහිර අයදුම්කරුවන් අතරින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයකින් හා/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් පුරප්පාඩු සංඛ්‍යාවෙන් 60% ක ප්‍රතිශතයක් හා අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් අයදුම්පත් කැඳවා සීමිත තරග විභාගයකින් හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පුරප්පාඩු සංඛ්‍යාවෙන් 40% ක ප්‍රතිශතයක් යන පදනම මත බඳවා ගැනීම සිදු කෙරේ.

**පොදු කරුණු**

** **මෙම සියළු තනතුරු සඳහා අභ්‍යන්තරිකව ද අයදුම්පත් කැඳවීමට කටයුතු කරනු ලැබේ.**

**අතිරේක සුදුසුකම් :**

i. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව

ii. පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් තිබීම.

**වෙනත් :**

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ). ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ). තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ). විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

| ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ආකාරය | ලකුණු |
|---|---|
| 1. අදාළ අතිරේක සුදුසුකම් සඳහා | 30 |
| 2. අදාළ අතිරේක පළපුරුද්ද සඳහා | 30 |
| 3. අදාළ වෙනත් හැකියාවන් සඳහා | 15 |
| 4. සම්මුඛ පරීක්ෂණ කාර්යඵලය සඳහා | 25 |
| | 100 |

**සේවා කොන්දේසි :**

මෙම තනතුර ස්ථිරය. සේවා දායකයා විසින් වැටුපෙන් 10% ක් සහ කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය මගින් 12% යන පදනම යටතේ සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවනු ඇත. මණ්ඩලය මගින් වැටුපෙන් 3%ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදල සඳහා ද දායකත්වය සලසනු ලැබේ.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතු අතර, ඔවුන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ. තවද අපේක්ෂකයා තෝරා ගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදාහැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය :**

නම, ලිපිනය, වයස, අධ්‍යාපනික සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත්, සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ ඥාතීන් නොවන තොරතුරු දැන ගත හැකි පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් ද සහිතව 2020.12.03 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. සහතික වල පිටපත් අමුණා නැති හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තනතුරු කිහිපයක් සඳහා අයදුම්කරන්නේ නම් එක් තනතුරක් සඳහා එක් අයදුම්පතක් බැගින් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී තමන් අයදුම් කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කර එවිය යුතුය. බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

**සභාපති**
**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය,**
**අංක 117, සුභද්‍රාරාම පාර,**
**ගංගොඩවිල, නුගේගොඩ.**
**2020.11.16**

Source: Dinamina, Daily News (2020.11.20)